# භාවනාව සහ ධ්‍යාන සම්ප්‍රාප්තිය

ආචාර්ය, රාජකීය පණ්ඩිත පනාමුරේ චන්දිම හිමි

බෞද්ධ විමුක්ති මාර්ගයේ ආවසානික ඵලය වන නිර්වාණය අවබෝධ කරගැනීම සඳහා අනුගමනය කළ යුතු ප්‍රතිපදාවේ අතුරුඵල ලෙස ධ්‍යාන සම්ප්‍රාප්තිය හැඳින්විය හැකිය. භාවනාව දියුණු කිරීමෙන් ලැබෙන ඵලයන් ලෙස ධ්‍යාන හැඳින්විය හැකිය. අභිඥා යන වදනින් අර්ථවත් කරන්නේ ද මෙම ධ්‍යානයෝය. එසේම ඤාණ යන පර්යාය පදයක් ද මෙම අර්ථය සඳහා භාවිත වන ආකාරය දකිය හැකිය. අභිඥාපේක්ෂක යෝගාවචරයා ප්‍රථමයෙන්ම රූපාවචර ධ්‍යාන උපදවාගත යුතුය. බුදුසමයෙහි රූපාවචර ධ්‍යාන විග්‍රහයේ දී චතුෂ්ක ක්‍රමය හා පඤ්චම ක්‍රමය යනුවෙන් ක්‍රම දෙකක් භාවිත කර ඇත. සූත්‍ර දේශනාවන්හි දක්වෙන ආකාරයට චතුෂ්ක ක්‍රමය වන්නේ,

රූපාවචර ප්‍රථම ධ්‍යානය

රූපාවචර ද්විතිය ධ්‍යානය

රූපවචර තෘතිය ධ්‍යානය

රූපාවචර චතුර්ථ ධ්‍යානය[1]

යන ධ්‍යාන සතරයි. ධ්‍යානයට සමවැදුණු යෝගාවචරයාට ඉන් අනතුරුව අභිඥා උපදවා ගතහැකි බව මූලික නිකාය ග්‍රන්ථයන්හි සඳහන් වුව ද අටුවා විවරණවලට අනුව නම් සතර ආරූප්‍ය හෙවත් අරූපාවචර ධ්‍යාන සතරට ද සමවැදිය යුතු බව හේනේපොල ගුණරතන හිමියෝ පවසති.[2] බුදුසමයෙහි දක්වෙන එම අරූපාවචර ධ්‍යාන සතර නම්

ආකාසානඤ්චායතන ධ්‍යානය

විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය

ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානය

නේවසඤ්ඤානාසඤ්ඤායතන ධ්‍යානය

යනුවෙනි.

යථෝක්ත රූපාවචර ධ්‍යාන සතර හා අරූපාවචර ධ්‍යාන සතර පොදුවේ අෂ්ට සමාපත්ති ලෙස හඳුන්වනු ලැබේ.

ධ්‍යාන යනුවෙන් අවධාරණය කර තිබෙන්නේ මිනිස් චිත්ත සන්තානයෙහි ඇතිකර ගන්නා වූ ප්‍රබල ඒකාග්‍ර බවයි.[3] මෙම ධ්‍යාන වැඩීම සඳහා විවේකය අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා වස්තු කාමයන්ගෙන් හා ක්ලේශ කාමයන්ගෙන් වෙන් වූ විට විවේකය හටගනී. වස්තු කාමයන්ගෙන් ඉවත්වීම මුල්කරගෙන කාය විවේකයත් ක්ලේශ කාමයන්ගෙන් වෙන්වීම හේතුකොට ගෙන චිත්ත විවේකයත් උපදී. එසේම පංච නීවරණ ධර්මයන්ගෙන් වෙන්වීම සඳහා ධ්‍යාන අංග පහක් වර්ධනය කළයුතු බව විසුද්ධි මාර්ගයේ දක්වෙයි.[4]

එනම්,

| | | |
|---|---|---|
| ඒකග්ගතාවයෙන් | - | කාමච්ඡන්දය ද |
| පීතියෙන් | - | ව්‍යාපාදය ද |
| විතර්කයෙන් | - | ථිනමිද්ධය ද |
| සුඛයෙන් | - | උද්දච්ච කුක්කුච්චය ද |
| විචාරයෙන් | - | විචිකිච්ඡාව ද |

යටපත් කරමින් රූපාවචර ප්‍රථම ධ්‍යාන සිත උපදවා ගත යුතුය. තවදුරටත් රාග, ද්වේශ, මෝහ, ශ්‍රද්ධා, බුද්ධි, විතර්ක යන චරිත හය අතුරෙන් ගැළපෙන භාවනාවක් තෝරා ගනිමින් නාම



රූප ධර්මයන් කෙරෙහි ඇලීම් බැඳීම්වලින් තොරව වාසය කළ යුතුය. කාමච්ඡන්දය ණය ගැනුමකට සමානය. එවිට එයින් මිදීම ණයකින් නිදහස් වූවක් වැනිය. ව්‍යාපාදය දීර්ඝකාලීනව පීඩා විඳින රෝගයකට සමාන කොට ඇත. එබැවින් ව්‍යාපාදයෙන් මිදීම දීර්ඝකාලීනව පැවති රෝගයකින් නිදහස් වූවා වැනිය. ථීන මිද්ධය උපමාකර තිබෙන්නේ බන්ධනාගාර ගතවීමකටය. ථීන මිද්ධයෙන් මිදීම බන්ධනාගාරගත වීමෙන් මිදීමක් බඳුය. උද්ධච්චකුක්කුච්චය දාස බවට පත්වීමකට උපමා කරයි. මෙම නීවරණයන්ගෙන් මිදීම දිගුකාලීනව පත්ව සිටි දාස බවින් මිදීමකි.[5]

ප්‍රථම ධ්‍යානයට පැමිණි ධ්‍යානලාභියාට එම ධ්‍යානය ඉක්මවා දෙවන ධ්‍යානයට සමවැදීමට පළමුව

ආවජ්ජන වසිතා

සමාවජ්ජන වසිතා

අධිට්ඨාන වසිතා

වුට්ඨාන වසිතා

පච්චවෙක්ඛණ වසිතා

යනුවෙන් දක්වා ඇති පංච වසිතාවන් මෙනෙහි කළ යුතුය. ඉන්පසුව දෙවන ධ්‍යානයට සමවැදීමට යමෙක් අපේක්ෂා කරයි නම්

විතක්ක

විචාර

පීති

සුඛ

ඒකග්ගතා

යන අංග වැඩිය යුතුය. ඉන්පසුව දෙවන ධ්‍යානයෙහි ආදීනව දකිමින් තෙවන ධ්‍යානය උපදවා ගනී. තවදුරටත් භාවනාව වැඩීමෙන් තෙවන ධ්‍යානය ලබාගනියි. මෙසේ ක්‍රම ක්‍රමයෙන්

භාවනාව වැඩීම තුළින් සිව්වන ධ්‍යානය ලබාගනියි. ධ්‍යාන සමාපත්තීන් ලෞකික වුව ද එමගින් පවතින දැඩි ලෝභය ක්‍රෝධය ආදිය ඉවත්කර කරුණාව මෛත්‍රිය දයාව පරෝපකාරය වැනි ගුණ ධර්ම දියුණු කර ගනියි. ඇති දේ ඇති සැටියෙන් දැකීමට පෙළෙඹෙයි. ඉන්පසුව ධ්‍යාන සැපයන්ගේ ශ්‍රේෂ්ඨ බව ක්‍රමයෙන් වර්ධනය වෙයි.

ථෙරවාද බෞද්ධ සම්ප්‍රදාය අනුව චතුර්ථ ධ්‍යානය උපදවා ගැනීමෙන් පසුව අභිඥා උපදවා ගැනීම උදෙසා සිත මෙහෙය විය හැකිය. තවදුරටත් භාවනාවේ යෙදෙන යෝගාවචරයා හට පංචාභිඥා දක්වා සිත මෙහෙයවිය හැකිය. එසේ ලබාගන්නා වූ පංච අභිඥාවන් වන්නේ

ඉද්ධිවිධ ඤාණය

දිබ්බසෝත ඤාණය

චෙතොපරිය ඤාණය

පුබ්බෙනිවාසානුස්සති ඤාණය

චුතූපපාත ඤාණය

## ■ ඉද්ධිවිධ ඤාණය

ෂඩ් අභිඥා අතරින් පළමුවැන්න ඉද්ධිවිධ ඤාණයයි. එය අභිමතාර්ථය නිපදවන අර්ථයෙන් ද ලැබීම් අර්ථයෙන්ද 'ඉද්ධි' නම් වෙයි. ආකාර රාශියකින් යුක්ත වන බැවින් 'විධ' යන්න ද එහි අගට එකතු වී 'ඉද්ධිවිධ' යන්න සැකසී ඇත. විවිධ ඍද්ධි ප්‍රාතිහාර්යයන් පෑමට උපකාරි වන බැවින් ඉද්ධිවිධ නම් වේ.[6] මෙම ඉද්ධිවිධ ඤාණය උපදවා ගැනීමට උපකාරි වන මූලික ප්‍රත්‍ය උපදවා ගන්නා ආකාරය හා එමගින් අපේක්ෂිත අරමුණු යන සාධක පදනම් කරගෙන මෙම ඉද්ධිවිධ ඤාණයෙහි ප්‍රභේද දහයක් විසුද්ධි මාර්ගයෙහි දක්වා ඇත. එනම්,



අධිට්ඨාන ඉද්ධි, විකුබ්බන ඉද්ධි, මනොමය ඉද්ධි, ඤාණවිප්පාර ඉද්ධි, සමාධි විප්පාර ඉද්ධි, අරිය ඉද්ධි, කම්ම විපාකජ ඉද්ධි, පුඤ්ඤවතො ඉද්ධිවිජ්ජාමය ඉද්ධි, සම්මාපයෝගපච්චය ඉද්ධි තමන් දහසක් වේවායි සිතා අධිෂ්ඨාන කිරීමෙන් නිපදවාගත හැකි ඍද්ධිය අධිෂ්ඨාන ඍද්ධිය නම් වේ. ස්වකීය ප්‍රකෘතිය හැරදමා නාග ආදි විකෘති වේශයන් නිර්මිත කොට දැක්විය හැකි ඍද්ධිය විකුබ්බන ඍද්ධි නම් වේ. අභිඤ්ඤා ලාභියෙකුට තමාගේ ප්‍රකෘති ශරීරයට හාත්පසින් ම සමාන වූ මනෝමය ශරීරයක් මවාගත හැකිය. එය මනෝමය ඍද්ධිය නම් වෙයි. අරහත්ඵල ලාභයට වාසනාව ඇති සත්වයන්ට නිවන් දකින භවයේ ප්‍රතිසන්ධියේ පටන් අරහත් ප්‍රතිලාභයෙන් පසු ස්කන්ධ පරිනිර්වාණය තෙක් අතර කාලය තුළ සිදුවන විවිධ ප්‍රාතිහාර්යයන්ට උපකාරි වන ඤාණ ඍද්ධිය ඤාණ විප්පාර ඍද්ධි නම් වෙයි. සඤ්ඤා වේදයිත නිරෝධ සමාපත්තියට සමවැදුණු සමාධිලාභියාට එකී සමාපත්ති කාලය තුළ කිසිඳු අයුරකින් උපද්‍රවයක් නොවීමට බලපානු ලබන්නේ සමාධි විප්පාර ඍද්ධිය නම් වෙයි. ක්ෂීණාශ්‍රවාදි ආර්යයන්ට බාහිර සුභාසුභ අරමුණුවල තමා කැමති සඤ්ඤාවක් උපදවාගෙන සිටීමට උපකාරි වන ඍද්ධිය අරිය ඍද්ධි නම් වෙයි. සියලු පක්ෂීන්ගේ ද සියලු දෙවියන්ගේ ද ආදි කල්පිකාදි ඇතැම් මනුෂ්‍යයන්ගේ ප්‍රේතාදි ඇතැම් විනිපාතිකයන්ගේ ද අහසින් යාම පිරිසිඳු ඇස් ඇතිවීම ආදියට හේතුවන ඍද්ධිය කම්මපාකාර ඍද්ධිය නම් වෙයි. මුහුකුරා ගිය පූජ්‍ය සම්භාර ඇති කල්හි සක්විති රාජාදීන්ට ධන නිධානාදිය පහළවීම උපකාරි වන ඍද්ධි පුඤ්ඤවතෝ ඍද්ධිය නම් වෙයි. විද්‍යාධරයින්ට ගන්ධාරි විද්‍යාදි විද්‍යා ජපකොට මන්ත්‍ර බලයෙන් අහසින් යාමට අහසෙහි සිව්රඟ සෙනඟ මවා පෑමට උපකාර වන්නේ විජ්ජාමය ඍද්ධියයි. ඒ ඒ තන්හි සම්‍යග් ප්‍රයෝගයෙන් තමා කැමති දෙය ඉටු කිරීමේ හැකියාව ලැබෙන ඍද්ධිය සම්මාපයොග පච්චය ඍද්ධිය නම් වෙයි.

මෙම දශ ආකාර වූ ඍද්ධි අතුරින් අධිෂ්ඨාන, විකුබ්බන හා මනොමය යන ඍද්ධි ප්‍රමුඛස්ථානයෙහි ලා සලකනු ලැබේ. ඉද්ධිවිධ ඤාණයෙන් ප්‍රාතිහාර්ය පෑමට බලාපොරොත්තු වන්නා ඊට ප්‍රථම යෝග්‍ය භූමි සතර, පාද සතර පද හෙවත් කාරණ අට හා සෝළස මූලයන් ද සම්පූර්ණ කළයුතුය.[7] මෙම ඉද්ධිවිධ ඤාණය ක්‍රියාත්මක වන ආකාරය අනුව ද කොටස් රාශියකට බෙදා දක්වේ.[8] එනම්

- එක් අයෙකු බොහෝ දෙනෙකු වීම.
- බොහෝ දෙනෙක් එක් අයෙකු වීම.
- බිත්ති පවුරු ආදියෙන් ආවරණය වූ දෑ විවෘත කොට පෙන්වීම.
- විවෘතව පෙනිය යුතු දෑ නොපෙනි යාමට සැලැස්සීම.
- බිත්ති ප්‍රාකාර පර්වතාදියේ නොගැවෙමින් අහසෙහි මෙන් ඒ හරහා ගමන් කිරීම.
- ජලයෙන් මෙන් පොළොවෙහි යට කිමිදීම, උඩ නැඟීමාදිය කිරීම.
- පොළොවෙහි මෙන් ජලයෙහි නොගිලී විවිධ ඉරියව් පැවැත්වීම.
- පක්ෂියෙකු මෙන් අහසෙහි ගමන් කිරීම.
- මනු සූර්යයන් අතින් ස්පර්ශ කිරීම.
- බඹලොව දක්වා තම ශරීරයෙන් වසඟයට ගැනීම.

යථෝක්ත ප්‍රාතිහාර්යයන් අතරින් කිසියම් හෝ ප්‍රාතිහාර්යයක් පෑමට අපේක්ෂා කරන ඉද්ධිවිධ ඤාණලාභී යෝගාවචරයා පළමුව අභිඥා පාදක චතුර්ථ ධ්‍යානයට සමවැද එයින් නැගී අපේක්ෂිත



ඒ ඒ ප්‍රාතිහාර්යයට අදාළ පුද්ගල වස්තු ස්ථාන හා ක්‍රියාකාරකම් ආදි සාධක ඒ ඒ ප්‍රාතිහාර්යයට යෝග්‍ය පරිදි සැකසෙත්වායි අධිෂ්ඨාන කොට නැවතත් චතුර්ථ ධ්‍යානයට සමවැද එයින් නැගී යථෝක්ත අධිෂ්ඨානය ම කළ යුතුය. එම අධිෂ්ඨාන සිත පහළ වනවාත් සමග ම අපේක්ෂිත සියලු සාධක ඒ ඒ ප්‍රාතිහාර්යයට යෝග්‍ය පරිදි සකස් වෙති. යෝගාවචරයා හට යථෝක්ත ප්‍රාතිහාර්යයන් අතරින් තමා කැමති ප්‍රාතිහාර්යයක් එහි සිදුකළ හැකිය.

## ■ දිබ්බසෝත ඤාණය

දෙව්ලොව දෙවියන්ට පූර්ව පුණ්‍ය කර්මයන් බලයෙන් උපන්නා වූ ඉතා දුර වූ ද ඉතා සියුම් වූ ද ශබ්ද ශ්‍රවණය කළ හැකි දිව්‍යමය සොත ධාතුවට සමාන වූ හෙයින් ද යෝගාවචරයාගේ වීර්ය භාවනා බලයෙන් උපදනා හෙයින් ද දෙවියන්ට සමානව ශබ්ද ශ්‍රවණය කළ හැකි හෙයින් ද එකී ශබ්දවල විවිධ ස්වභාවයන් මනාව අවබෝධ කරගන්නා හෙයින් ද දිව්‍යමය විහරණ සංඛ්‍යාත රූපාවචර චතුර්ථ ධ්‍යානය පාදක කරගෙන උපදනා හෙයින් ද ඇසීම් මාත්‍රය සිදු කරන සෝත ධාතුවට සමාන හෙයින් ද දිබ්බසෝත ධාතු නමින් හැඳින්වෙයි.

අතිශයින්ම පවිත්‍ර වූ මෙම දිව්‍යමය සෝත ධාතුවෙන් සාමාන්‍ය මනුෂ්‍ය සෝත ඉන්ද්‍රිය විෂයයට ග්‍රහණය නොවන දෙව් මිනිස් දෙපාර්ශ්වයෙහි වූ උභය ශබ්දයෙන් ශ්‍රවණය කළ හැකිය. එසේම මෙම චක්‍රවාටයෙන් බාහිර වූ අන්‍ය චක්‍රවාටාදියෙහි ඇති ඉතා දුර වූ ශබ්ද මෙන්ම තම සිරුර මතුපිට සිටින උකුණු ආදීන්ගේ හා ශරීරාභ්‍යන්තරවාසී ක්ෂුද්‍ර ජීවීන්ගේ යම් සියුම් හෝ ශබ්දයක් වෙයි නම් එම සියලුම සියුම් ශබ්ද ද 'දිබ්බසොත ඤාණ'' ලාභී යෝගාවචරයාට මැනවින් ශ්‍රවණය කළ හැකිය.[9]

දෙව්ලොව දෙවියන් සතු ශ්‍රවණ ශක්තියට සමාන වූ ශ්‍රවණ ශක්තියක් මෙම ඤාණය උපදවා ගන්නා යෝගාවචරයාට ද

ලැබෙන බැවින් මෙම ඤාණය 'දිබ්බසොත ඤාණය' නමින් හඳුන්වනු ලැබේ. මෙම 'දිබ්බසොත ඤාණය' ප්‍රකෘති සෝත ප්‍රසාදය හෙවත් නිරවුල් සෝත ඉන්ද්‍රිය ඇති අයටම මිස කර්ණාබාධ ඇති අයට හෝ බිහිරන්ට උපදවා ගත නොහැකි බවත් මෙම 'දිබ්බසොත ඤාණය' උපදවා ගැනීමෙන් පසු එහි අභිඥාලාභියා බිහිරෙකු බවට පත්වුවත් ඒ වනවිට උපදවාගෙන සිටි දිබ්බසොත ඤාණයට එමගින් හානියක් නොමැති බව මූලාශ්‍රය සඳහන් කරයි.

චතුර්ථ ධ්‍යානයට සමවැදීමෙන් අනතුරුව එයින් නැගී සිට පළමු කොට ප්‍රකෘති සෝත ඉන්ද්‍රියට විෂය වන්නාවූ තුන් යොදුනක් දුර වූ අරණ්‍යාදි බැහැර තැන්හි වූ සිංහයන් ආදි කොට ඇති සත්ත්වයන්ගේ ශබ්ද ආවර්ජනා කළ යුතුය. නැවත එතැන් සිට ක්‍රමයෙන් ළං ළං පැමිණ තමා සිටින විහාරයෙහි ගෙඩිය ගසන ශබ්දය, බෙර ගසන ශබ්දය සක් පිඹීමේ ශබ්දය භික්ෂු සාමණේරයන්ගේ වේගවත් වූ සජ්ඣායන ශබ්දය, ප්‍රකෘති කතා ශබ්දය, පක්ෂීන්ගේ ශබ්ද, පාද තබන ශබ්ද, අව්වෙහි වියලෙන තල්පත්වල ශබ්දය හා කුරා කුහුඹුවන්ගේ ශබ්දය යනාදි සියලු ශබ්ද ආවර්ජනය කළ යුතුය. එසේ නැගෙනහිර, බටහිර, උතුර, දකුණ, උඩ, යන දිශාවන්හි වූ ශබ්ද ද නිරිත, ඊසාන, වයඹ, ගිනිකොණ යන අනුදිශාවන්ගේ වූ ශබ්ද ද ආවර්ජනය කළ යුතුය. එවිට ඒ ඒ ශබ්ද ප්‍රකෘති සිතට වැටහෙයි. සමාධිගත සිතට අතිශයින්ම වැටහෙන තත්ත්වයට පත්වෙයි.

මෙසේ ශබ්ද නිමිති මෙනෙහි කරන යෝගාවචරයා හට දූන් දිබ්බසොත ඤාණය උපදන යැයි දූනෙන මොහෙතෙහි ශ්‍රවණය කරන ලද යම්කිසි ශබ්දයක් අරමුණු කොට මනෝද්වාරවජ්ජන සිතක් ඉපදී නිරුද්ධ වූ කළ තියුණු නුවණැත්තාට උපචාර අනුලෝම ගෝත්‍රභූ යන කාමාවචර ජවන සිත් තුනට අනතුරුව සතර වනුව හෝ මඳ නුවණැත්තාට පරිකර්ම උපමාව අනුලෝම ගෝත්‍ර යන කාමාවචර ජවන සිත් සතරට අනතුරුව පස්වානුව



හෝ රූපාවචර චතුර්ථධ්‍යාන අර්පනා සිත උපදි ඒ සිතෙහි උපදනා ඥානය දිබ්බසෝත ඤාණය නම් වේ.

මැනවින් උපදවා ගන්නා දිබ්බසෝත ඤාණය, මනාව ස්ථිර කර ගැනීම සඳහා යෝගාවචරයා අභිඥා පාදක චතුර්ථ ධ්‍යානයට සමවැදි නැවත එයින් නැගි මේතාක් ශබ්ද අසමියි පළමුව එක් අඟලක් පමණ තැන් අධිෂ්ඨාන කළ යුතුය. අනතුරුව සතරඟුල, අටඟුල, වියත, රියන, .... ආරාමය ඉදිරියේ තිබෙන ශාලාව පිරිවෙණ සංඝාරාමය ගොදුරුගම දනව්ව ආදි වශයෙන් ක්‍රමයෙන් සක්වල තෙක් ද එයින් පිටත ද අධිෂ්ඨාන කළ යුතුය. එවිට දිබ්බසොත ඤාණය ස්ථිරව, පිහිටයි. ඒ ආකාරයට ස්ථිර කර ගන්නා දිබ්බසෝත ඤාණය ඇති යෝගාවචරයා නැවත චතුර්ථ ධ්‍යානයට සම නොවැද තම ශරීරාභ්‍යන්තරික වූ ඉතා සියුම් ශබ්ද ද ඉන් පරිබාහිර වූ ඉතා දුර වූ ඇති ශබ්ද ද මනාව ශ්‍රවණය කළ හැකිය. මෙසේ ශ්‍රවණය වන්නා වූ ශබ්ද එකිනෙකට බෙදා අසනු කැමැත්තේ නම් ඒ එක් එක් ශබ්දයක් පාසා නැවත නැවත අභිඥා පාදක චතුර්ථ ධ්‍යානයට සමවැදිය යුතුය.[10]

මෙම තත්ත්වයට පිළිපන් යෝගාවචරයාගේ ස්වභාවය දීඝනිකායේ මැනවින් පැහැදිලි කර ඇත්තේ මෙසේය. "මහ මගට පිළිපන් පුරුෂයෙක් තමාට ඇසෙන විවිධාකාර බෙර හඬවලින් මෙය මිහිඟු බෙර හඬය. මෙය පණ බෙර හඬය. මෙය ගැට බෙර හඬය යනුවෙන් වෙන් වෙන්ව මනාව හඳුනා ගන්නා සේ යෝගාවචරයා ද තමාට ඇසෙන ඉතා දුර වූ ද ඉතා සියුම් වූද ශබ්ද වෙන් වෙන්ව හඳුනා ගැනීමට සමත්වෙයි, යනුවෙන් දක්වා ඇත.[11]

සාමාන්‍ය පුද්ගලයන් අනුමාන වශයෙන් බැස ගන්නා ඇතැම් නිගමන පිළිබඳ ඍජු අවබෝධයක් ලබා ගැනීමට 'දිබ්බ සොත ඤාණලාභියා සමත් වන බවත් හේතු ප්‍රත්‍ය සම්බන්ධතා පිළිබඳ ඇතැම් කරුණු පවා නිශ්චිත අයුරින් වටහා ගැනීමට එය හේතුවන බව මහාචාර්ය ඩී.ජේ. කළුපහන මහතා පෙන්වා දෙයි. මාගන්දිය

තවුසා සහ භාරද්වාජ බ්‍රාහ්මණයා අතර සිදු වූ සාකච්ඡාවක් බුදුරජාණන් වහන්සේ දුර සිට ශ්‍රවණය කළ බව සඳහන් වන මජ්ඣිම නිකායාගත වාර්තාව ඊට නිදසුනක් ලෙස එතුමා පෙන්වා දෙයි.[12]

## ■ චේතොපරිය ඤාණය

ෂඩ් අභිඥාවන් අතරින් තෙවැන්න චේතොපරිය ඤාණයයි. මෙම අභිඥාව උපදවා ගත් යෝගාවචරයාට තමාගේ සිතින් අන්‍ය සත්ත්වයන්ගේ සිතෙහි පවතින සරාගාදි සියලු ම චෛතසික ස්වභාවයන් මනාව වටහාගත හැකි බැවින් මෙම අභිඥාව 'චේතොපරිය' හෙවත් පරචිත්ත විජානන ඤාණය ලෙස හඳුන්වනු ලැබේ. මෙම චේතෝපරිය ඤාණාපෙක්ෂක යෝගාවචරයා ඊට ප්‍රථමව දිබ්බචක්ඛු ඤාණය උපදවාගෙන සිටිය යුතුය.

මෙම චේතොපරිය ඤාණය උපදවාගනු කැමති යෝගාවචර තෙමේ පළමුව අභිඥා පාදක චතුර්ථ ධ්‍යානයට සමවැදී එය ස්ථිර බවට පමුණුවා ගත යුතුය. අනතුරුව දිබ්බචක්ඛු ඤාණය උපදවාගෙන කසිණ ලෝකය වඩා දිවැසින් අන්‍යයන්ගේ හෘදය වස්තුව ඇසුරු කොට පවත්නා රුධිරයෙහි වර්ණය බැලිය යුතුය. එම රුධිරය සොම්නස් සිතක් පවත්නා කළ ඉදුනු රතු නුග ගෙඩියක් සේ රතු වර්ණයෙන් ද දොම්නස් සිතක් පවත්නා කළ ඉදුණු දඹ ගෙඩියක් සේ කළු වර්ණයෙන් ද උපේක්ෂා සහගත සිතක් පවත්නා කළ පිරිසිඳු තළ තෙල් බඳු රන්වන් වර්ණයෙන් ද යුක්ත වෙයි. මේ ආකාරයට රුධිරය බලා ඒ අනුව දුන මොහුගේ සිත සොම්නස් සහගතය. දොම්නස් සහගතය, උපේක්ෂා සහගතය යනුවෙන් හඳුනාගත යුතුය. නැවත චතුර්ථ ධ්‍යානයට සමවැද මනෝද්වාරාවජ්ජන සිතක් උපදී. එය චේතොපරිය ඤාණයයි.

යෝගාවචරයා ඉහත දක්වන ලද අභිඥාවට නැවත නැවතත් සමවැදීම තුළින් මිනිස් වර්ගයා තුළ පවතින කාමාවචර රූපාවචර අරූපාවචර හා ලෝකෝත්තර සියලු සිත් දැනගත හැකිය.[13] එහෙත් ලෞකික අභිඥාලාභීන්ට දැකගත නොහැකිය. එහෙත් සෝවාන් ආදි මගඵල ලත් ආර්යයන්ට ද තමාට වඩා උසස් වූ මාර්ගඵලලාභී ආර්යයන්ගේ ලෝවිතුරා සිත් දැනගත නොහැකිය. රහතන් වහන්සේලාගේ චේතොපරිය ඤාණයෙන් සෑම පුද්ගලයෙකුගේ ම ලෝවිතුරා සිත් දැනගත හැකිය.



චේතොපරිය ඤාණය ප්‍රගුණ කළ තැනැත්තාට අන්‍යයන්ගේ රාග සහිත රාග රහිත දෝස සහිත දෝස රහිත මෝහ සහිත මෝහ රහිත හැකිළුණු සමාහිත අසමාහිත විමුක්ත අවිමුක්ත යන සොළොස් වැදෑරුම් සිත් වෙන් වෙන් වශයෙන් බැලිය හැකිය.[14] යමෙක් කණ්නාඩියකින් තම මුහුණ බලා එහි අඩුපාඩු සකස් කර ගන්නා සේ චේතොපරිය ඤාණලාභියා ද අන්‍යයන්ගේ සිතෙහි පවතින සියලු චෛතසිකයන් ඒ අයුරින් ම වෙන් වෙන්ව දැන ගනියි.[15]

## ■ පුබ්බේ නිවාසානුස්සති ඤාණය

ෂඩ් අභිඥාවන් අතරින් සිව්වැන්න පුබ්බේනිවාසානුස්සති ඤාණයයි. පෙර භවයන්හි කාම, රූප, අරූප ආදි වශයෙන් නොයෙක් භවයන්හි පැවත ආ ඤාණය නම් වේ.[16]

මෙම අභිඥාව විවිධ මට්ටමින් උපදවාගත හැකි පුද්ගල කොටස් හයක් පිළිබඳ විසුද්ධි මාර්ගයේ දක්වේ. ඒ අනුව බෞද්ධ ප්‍රතිපදාවන්ගෙන් බාහිර වූ තාපසාදීන්ට සතළිස් කල්පයක් ද ප්‍රකෘති ශ්‍රාවකයන්ට කල්ප සියයක් ද අසූමහා ශ්‍රාවකයන්ට කල්ප ලක්ෂයක් ද අග්‍ර ශ්‍රාවකයන්ට ඒකාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ද පසේ බුදුවරුන්ට දෙයාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ද ලෝවුතුරා බුදුන් වහන්සේට අසීමාන්තික කාලයක් ද අතීතය ආවර්ජනය කළ හැකිය. එසේම 'පුබ්බේ නිවාසානුස්සතිය' පිළිබඳ අන්‍ය තීර්ථකයන්ගේ ඥානය කණාමැදිරි එළියකට ද ප්‍රකෘති ශ්‍රාවකයන්ගේ ඥානය ඕෂධී තාරකාවකට ද පසේ බුදුවරයන්ගේ ඥානය සඳ එළියකට ද ලොව්තුරා සම්මා සම්බුදුරජාණන්

වහන්සේගේ ඥානය මධ්‍යාහ්න සූර්යයෙකුට ද උපමා කර ඇත.[17]

මෙම 'පුබ්බේනිවාසානුස්සති, ඤාණාපෙක්ෂක යෝගාවචරයා පසු බත පිණ්ඩපාතයෙන් වැළකී හුදකලාව හිඳ අභිඥා පාදක චතුර්ථ ධ්‍යානයට සමවැද නැවත එයින් නැගී සිට මේ ධ්‍යානයෙහි හිඳගත් ආකාරය පළමුව ආවර්ජනා කළ යුතුය. නැවත එතැන් සිට පිළිවෙළින් අසුන් පැනවීමය. සෙනසුනට පිවිසීමය. පා සිවුරු තැන්පත් කිරීමය. දත් වැළඳීමය. ගමින් පෙරළා ඒමය. පිඬු සිඟීමය. පිඬු පිණිස ගමට යෑමය. විහාරයෙන් නික්මීමය. දාගැබ් මහබෝ වැඳීමය. පා දෙවීමය. පාත්‍රය පිළිගැනීමය. එයට පෙර මුව දෝවනය කිරීම තෙක් කළ දෑ ද උදෑසන කාලයෙහි කළ දෑ ද මැදියම කළ දෑ ද පෙරයම කළ දෑ දූයි මුළු දවසෙ ම කළ දෑ ප්‍රතිලෝම වශයෙන් ආවර්ජනා කළ යුතුය.

කිසියම් පුද්ගලයෙක් සිය ගමින් වෙනත් ගමකට ගොස් එතැනින් තවත් ගමකට ගොස් නැවතත් සිය ගමට පැමිණේ ද එසේ පෙරළා පැමිණි ඔහුට මම මගේ ගමින් අසවල් ගමට ගියෙමි. එහි මෙසේ සිටියෙමි. මෙසේ හුන්නෙමි මෙසේ කතා කළෙමි. මෙසේ නිහඬ වීමි. ඒ ගමින් අසවල් ගමට ගියෙමි. එහිද මේ අයුරින් හැසිරුණෙමියි. මෙනෙහි කළ හැකි වන්නා සේ මෙම 'පුබ්බේනිවාසානුසස්ති ඤාණ' සිතින් තමාගේ හා අන්‍යයන්ගේ පෙර භවයන්හි වූ විවිධාකාර ස්කන්ධ පරම්පරාවන් මෙන්ම චූති ප්‍රතිසන්ධි පිළිවෙළ ද සිහිකළ හැකිය.[18]

## ■ දිබ්බචක්ඛු ඤාණය

ෂඩ් අභිඥාවන් අතරින් පස්වැන්න 'චූතුපපාත' හෙවත් දිබ්බචක්ඛු ඤාණයයි. සත්ත්වයන්ගේ චුති උප්පත්ති ආදිය නිවැරදිව දැන ගැනීමට මෙම චුතුපපාත හෙවත් දිබ්බචක්ඛු නමින් හඳුන්වන අභිඥාව උපකාරි වේ.

දෙව්ලොව දෙවියන්ට පූර්ව කුශල කර්මානුභාවයෙන් උපන් ඉතා දුරු වූ ද ඉතා සියුම් වූ ද රූපාලම්භනාදිය ග්‍රහණය කර



ගැනීමට සමත් වූ දිව්‍යමය ප්‍රසාද මනුෂ්‍යයාට සමාන වන හෙයින් ද යෝගාවචරයාගේ වීර්ය භාවනා බලයෙන් උපදනා හෙයින් ද දිව්‍ය විහරණ සංඛ්‍යාත රූපාවචර චතුර්ථ ධ්‍යානය පාදක කරගෙන උපදනා හෙයින් ද ආලෝක කසිණ භාවනා මාර්ගයෙන් ලැබිය යුතු හෙයින් ද මෙමගින් තමාගේ ඥානාලෝකය පැතිරෙන හෙයින් ද බිත්ති පර්වතාදියෙන් ආවරණය වූ රූපාදිය බැලිය හැකි හෙයින් ද ඇසක් වැනි වූ ද මෙම ඥානමය ඇස දිබ්බචක්ඛු නමින් හඳුන්වනු ලැබේ.

මෙම අභිඥාව උපදවා ගන්නා ආකාරය උපමාවක් ආශ්‍රයෙන් විසුද්ධි මාර්ගයෙහි විස්තර කර තිබේ. එනම් එක් මිනිසෙක් ගිනි සුළක් ගෙන රෑ මගට පිවිසෙයි. ඒ ගිනි සුළ නිමුණු විට ඔහුට මාර්ගයෙහි සම විසම තැන් නොපෙනෙයි. එනිසා හෙතෙම එම ගිනි සුළ බිම ගසා නැවත දල්වා ගත්තේය. පෙර තිබූ එළියට වඩා එළියක් එවිට ඇතිවන්නේය. මෙසේ නැවත නැවත එය සකස් කරමින් ගමන් කරණා විට සූර්යයා උදාවෙයි. ඉන්පසු ඔහුට ගිනි සුළෙන් ප්‍රයෝජනයක් නැති හෙයින් එය ඉවත දමා සූර්යාලෝකයෙන් ගමන් කරයි. යනුවෙනි.[19]

මෙම අභිඥාව උපදවාගත් යෝගාවචරයාට සාමාන්‍ය මිනිස් ඇසින් දැකිය නොහැකි ඉතා සියුම් වූ ද ඉතා දුර වූ ද රූපාදිය මෙන්ම සත්ත්වයන්ගේ චුතිය හා උත්පත්තිය ද අනතුරු භවයෙහි උස් පහත් බව ද පැහැපත්වීම හා දුර්වර්ණ වීම ද සුගති හා දුගති බවද ඒ ඒ සත්වයන්ගේ කර්මානුරූප භව ගමන ද දැනගත හැකිය. එසේම යෝගාවචරයාගේ සාමාන්‍ය මසැසට ග්‍රහණය නොවන කුස තුළ වූ රූප ද හෘදය වස්තුව ඇසුරු කොට පවත්නා රූප ද පොළොව යට පවත්නා රූප ද බිත්ති පුවරු ආදියෙන් ආවරණය වූ රූප ද මෙම සක්වලින් බැහැර වූ රූප ද යනාදි රූප මසසින් දක්නා සේ මැනවින් දැකිය හැකිය.[20]

දිබ්බචක්ඛු ඤාණය පහළවීමත් සමග පරිවාර ඤාණ දෙකක් පහළ වෙයි. එනම් 'යථාකම්මුපග හා අනාගතංස වශයෙනි. එනම්

යථාකම්මුපග යනුවෙන් හඳුන්වන්නේ අපාගත සත්ත්වයන් නිරයෙහි දුක් විඳින ආකාරය හා දිව්‍යලෝකයෙහි දෙවි දේවතාවුන් සැප විඳින ආකාරය පිළිබඳ දැකීමට ඇති හැකියාවයි. අනාගතංස ඤාණය යනු අනාගතයෙහි මෛත්‍රිය නමින් සම්බුදු රජාණන් වහන්සේ නමක් ලෝකයෙහි පහළ වෙයි. උන් වහන්සේගේ බුද්ධානුභාවය මෙසේය. ආදි වශයෙන් දැකීමට ඇති හැකියාවයි.

එසේම පෘථග්ජන යෝගාවචරයා මෙම අභිඥාවට සමවැදී මේ මේ තැන ආලෝක වේවායි අධිෂ්ඨාන කළේ නම් ඒ ඒ පෘථුවි සමුද්‍ර පර්වතාදිය විනිවිද ඒකාලෝක වෙයි. එවිට ඒවායෙහි සිටින යක්ෂ රාක්ෂ ආදි දර්ශනයන්ගෙන් බිය උපදවාගෙන චිත්ත වික්ෂෝපයට පත්විය හැකිය. ධ්‍යානයෙන් පවා පිරිහී උමතු බවට ද පැමිණිය හැකිය. මෙම දිබ්බචක්ඛු ඤාණය පෘථග්ජනයන්ට අන්තරායකර වන්නේ යැයි පැවසෙන්නේ එබැවිනි.[21]

## ■ ආසවක්ඛය ඤාණය

ෂඩ් අභිඥාවන්හි අවසන් අභිඥාව ආසවක්ඛය ඤාණය නම් වෙයි. තම සිතෙහි පවතින්නා වූ සියලු ආශ්‍රව ධර්ම ක්ෂය වූ බව තම ප්‍රඥාවෙන් ම අවබෝධ කර ගැනීමෙන් පහළ වන ඤාණය ආසවක්ඛය ඤාණය නම් වෙයි.[22] බුදුදහමට පමණක් අනන්‍ය වූ එකම ඤාණය මේ නමින් හඳුන්වා ඇත.

මෙම ධ්‍යානය උපදවා ගැනීමට අපේක්ෂා කරන යෝගාවචරයා පළමුව තම සිත සමාධිගත කරගත යුතුය. උපක්ලේශ රහිත කරගත යුතුය. පසුව එම සිත සියලු ආශ්‍රව දුරු කිරීම කෙරෙහි යෙදවිය යුතුය. එවිට මෙය දුක යැයි ද මෙය දුකට හේතුව යැයි ද මෙය දුක නැති කිරීම හෙවත් නිරෝධය යැයි ද මෙය දුක නැතිකිරීමේ මාවත යැයි ද අවබෝධ වෙයි. ආශ්‍රව නිරෝධයට එය උපකාරි වන බව ද අවබෝධ කරගත යුතුය.

මේ ආකාරයට දුක ඇතිවීමට හේතුවන සියලු ලක්ෂණයන් මැනවින් දැනගන්නා වූත් දැකගන්නා වූත් යෝගාවචරයාගේ සිත



කාමාශ්‍රවයන්ගෙන් ද භවාශ්‍රමයන්ගෙන් ද අවිජ්ජාශ්‍රවයන්ගෙන් ද අනවශේෂයෙන් මිදෙයි. එවිට ඔහුට තම සිත සියලු ආශ්‍රවයන්ගෙන් මනාව මිදුණේය යන ඥානය පහළ වෙයි. එමෙන්ම තමාගේ භව ගමන කෙළවර වූ බව ද බ්‍රහ්මචර්යාවෙහි වැඩ නිමවන ලද බව ද කළයුතු සියලු දෑ කර අවසන් වූ බව ද වෙනත් කළ යුතු කිසිවක් නැති බව ද ඔහු දැන ගනියි.[23] මෙකී අවබෝධාත්මක ඤාණය 'ආසවක්ඛය ඤාණය නම් වෙයි. බෞද්ධ ප්‍රතිපදාවේ ආවසානික අරමුණ වන්නේ ද මෙම ආසවක්ඛය ඤාණය අවබෝධකර ගැනීමයි. පෙළ දහමේ 'විඤ්ඤා ආසවක්ඛය ඤාණය, යථාභූත ඤාණය විමුක්ති ඤාණය දස්සන යනාදි වචනවලින් ද හඳුන්වනු ලබන්නේ මෙම ඤාණ තත්ත්වයට වේ.

මෙම ඤාණයෙහි ස්වභාවය දක්වා ඇත්තේ කඳු මුදුනක පිහිටි ප්‍රසන්න වූ අතිශයින් ප්‍රසන්න වූ නොකැළඹුණු දිය ඇත්තා වූ විලක ඉවුරෙහි සිටගත් මිනිසෙක් ඒ විල තුළ හැසිරෙන සිප්පි බෙල්ලන්, මාලු ආදීන්ගේ සියලු චර්යාවන් මෙන්ම ඒ විල තුළ වූ කැට කැබිලිති ආදියෙහි ස්වරූපය ද වෙන් වෙන්ව මැනවින් දකින්නා සේ මෙම ආසවක්ඛය ඤාණලාභියා දුක හා ආශ්‍රව පිළිබඳ වූ සියලු ලක්ෂණයන්ගෙන් යථා ස්වරූපය මැනවින් අවබෝධ කර ගනියි.[24]

මේ ආකාරයට යෝගාවචරයා ධ්‍යාන සම්ප්‍රාප්තිය පිණිස ක්‍රියාකර ඉහත අධිගමයන්ගේ සාධනය කර ගන්නා ආකාරය අවබෝධ කරගත හැකිය.

## ආන්තික සටහන්

1. මජ්ඣිම නිකාය, අරියපරියෙසන සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 424 පිටුව.
2. Ven Gunarathana Henepola, The Path of Serenity and Insight, Dellhi, Reprint, 1996, 122 P.
3. අංගුත්තර නිකාය I, පංසු ධෝවක සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 452 පිටුව.
4. විසුද්ධි මාර්ගය, බෙන්තර සද්ධාතිස්ස සංස්කරණය විද්‍යාසාධක මුද්‍රණාලය, කොළඹ - 105 පිටුව
5. එම
6. එම 278
7. එම 287
8. දීඝනිකාය, සාමඤ්ඤඵල සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 136 පිටුව.
9. එම 138 පිටුව
10. විසුද්ධි මාර්ගය, බෙන්තර සද්ධාතිස්ස සංස්කරණය, විද්‍යාසාධක මුද්‍රණාලය, කොළඹ, 305 පිටුව.
11. දීඝනිකාය I, සාමඤ්ඤඵල සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 138 පිටුව.
12. Kalupahana D.J. Causality the Central Philosophy of Buddhist, Hawair 1975. 105 P.
13. විසුද්ධි මාර්ගය, බෙන්තර සද්ධාතිස්ස සංස්කරණය, විද්‍යාසාධක මුද්‍රණාලය, කොළඹ, 306 පිටුව.
14. සො පරසත්තානං පර පුග්ගලානං චෙතසා චෙතොපරිච්ච පජානාති, සරාගං වා, දීඝනිකාය I, සාමඤ්ඤඵල සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 138 පිටුව.
15 .එම. 140 පිටුව.
16. විසුද්ධි මාර්ගය, බෙන්තර සද්ධාතිස්ස සංස්කරණය, විද්‍යාසාධක මුද්‍රණාලය, කොළඹ, 307 පිටුව.
17. එම 307 පිටුව.
18. දීඝනිකාය I, සාමඤ්ඤඵල සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 140 පිටුව.
19. විසුද්ධි මාර්ගය, බෙන්තර සද්ධාතිස්ස සංස්කරණය, විද්‍යාසාධක මුද්‍රණාලය, කොළඹ, 320 පිටුව.
20. දීඝනිකාය I, සාමඤ්ඤඵල සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 144 පිටුව.
21. විසුද්ධි මාර්ගය, බෙන්තර සද්ධාතිස්ස සංස්කරණය, විද්‍යාසාධක මුද්‍රණාලය, කොළඹ, 321 පිටුව.
22. ආසවානං ඛයො පඤ්ඤාය සච්චකරණියො, දීඝනිකාය සංගීති සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 388 පිටුව.
23. දීඝනිකාය , සාමඤ්ඤඵල සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 144 පිටුව.
24. එම 146 පිටුව